# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2118/12 - 2019 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2019.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥා පනත

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරණ පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරණ (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමඟ කියවිය යුතු 3 වන වගන්තිය යටතේ වූ නියමය.

### නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංන 65 දරණ පනත් වලින් සංශෝධිත 1966 අංක 13 දරණ (451 වැනි අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 64(1) වගන්තිය සමඟ කියවිය යුතු 3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත උපලේඛනයේ මායිම් තුල පිහිටි හෙක්ටයාර් 13.9113 ක විශාලත්වයෙන් යුතු උක්ගල්කන්ද හෙවත් උක්ගල්දැත්ත වනාන්තරය වර්ෂ 2019 ක් වූ මාර්තු මස 18 වන දින සිට උක්ගල්කන්ද හෙවත් උක්ගල්දැත්ත රක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මාර්තු මස 18 වන දින,
කොළඹ දී ය.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි උක්ගල්කන්ද හෙවත් උක්ගල්දැත්ත වනාන්තරයට අයත් අඹගමුව කෝරළයේ හෝමාගම ගමෙහි FVP 110 පිඹුරේ බිම් කට්ටි අංක 320, 321, 327 දරණ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 13.9113 වපසරියකින් යුතු රජය සතු ඉඩම් ප්‍රදේශය වේ.


1A - PG 004469 - 242 (2019/04)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*උතුරට* : FVP 110 හි බිම් කට්ටි අංක 52, 51, 103, 49, 322, 43, 323, 46, 324, 325, FVP 109 අඹතලාව ගම් මායිම;

*නැගෙනහිරට* : FVP 109 අඹතලාව ගම් මායිම, FVP 110 හි කැබලි අංක 326, FVP 110 හි කැබලි අංක 331;

*දකුණට* : FVP 109 අඹතලාව ගම් මායිම, FVP 110 හි කැබලි අංක 122, 332, 109, 330, 108, 329, 328;

*බටහිරට* : FVP 110 හි කැබලි අංක 328, 103, 105, 319, 53, 52;

ප්‍රමාණය : හෙක්ටයාර් 13.9113

04 - 779

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.